තඹලගමුව ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
--------------------------

1. මූල්‍ය ප්‍රකාශනය
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 04 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර, පෙර වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 27 දින ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2017 අප්‍රේල් 16 දින සභා ලේකම්වරයා වෙත යවා තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට තඹලගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------

1.3.1 ගණකාධිකරණ ප්‍රතිපත්ති
----------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගණකාධිකරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කර නොතිබුණි.

1.3.2 ගණකාධිකරණ අඩුපාඩු
------------------------------

පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ සලසන ලද ප්‍රතිපාදන යටෙත් රු. 5,486,281 ක පිරිවැයට ඉදිකරන ලද වෙළඳපොල ගොඩනැගිල්ල 2016 අගෝස්තු මස නිමකර තිබුණි. එනමුත් ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්වලට ගෙන නොතිබුණි.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම
--------------------------------------------

රු.53,684,419 වටිනාකමැති, ඉඩම්, ගොඩනැගිලි යන්ත්‍ර, මෝටර් වාහන සහ කරත්ත සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

1.3.4 නීති,රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම
-----------------------------------------------

නීති,රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ

| | නීති,රීති,රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති පරිච්ඡේදය 1-වගන්තිය 5(xii) | මුදල් ගබඩා සහ චෙක්පත් අත්සන් කිරීමේ රාජකාරි කටයුතු නිලධාරීන් තිදෙනෙකුට |

පවරා තිබුණි. එනමුත්, ඔවුන්ගෙන් ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි.

(ආ) 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වූ නිශ්චල වත්කම් හඳුනාගෙන ඒ අනුව වරිපනම් හා බදු අයකර ගැනීම සඳහා ඒවායේ වටිනාකම් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.393,131 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය වූ රු. 438,752 ක මුදල සමඟ සැසඳූ විට රු.45,621 ක මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

2.2 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

2.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

2.3.1 මාර්ග බොරළු ඇතිරීම

--------------------------

2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිසමේ චක්‍රලේඛයේ1.2 පරිච්ඡේදය අනුව, මාර්ග දීර්ඝ කාල පරිච්ඡේදයක් සඳහා භාවිතා කරනු වස්, මාර්ගවල බොරළු ඇතිරීම වැනි තාවකාලික කටයුතු නොකර, කාපට් කිරීම, තාර දැමීම, කොන්ක්‍රීට් කිරීම වැනි කටයුතු සිදු කළ යුතුවේ. ඒ නමුත් චක්‍රලේඛ උපදෙස් උල්ලංඝනය කරමින්, රු. 370,095 ක පිරිවැයකට සභාව විසින් මාර්ග බොරළු අතුරා තිබුණි.

2.3.2 පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ වූ හරිත නගර ක්‍රීඩා පිටිය පිළිසකර කිරීමේ කොන්ත්‍රාත්තුව 2014 අගෝස්තු 12 දින ප්‍රදානය කර, ප්‍රමාණ පත්‍රවල සඳහන් වැඩ සතුටුදායක ලෙස නිමකර ඇති බවට කාර්මික නිලධාරීන් වෙතින් සහතිකයක් කොන්ත්‍රාත්කරුට ලබාදී රු.3,345,139 ක මුදලක් ගෙවා තිබුණි. ඒ නමුත් ළමා පිටිය සහ කෙළිබිම පින්තාරු කිරීම, ජල ටැංකිය සවිකිරීම වැනි නිම නොකළ වැඩ සඳහා රු. 191,875 ක මුදලක් මෙයට ඇතුළත් කර තිබුණි.

2.3.3 2015 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වාහන අංගනය වටා තාප්පයක් ඉදිකිරීම සඳහා රු.790,400 ක කොන්ත්‍රාත්තුවක් මුල්ලිපොතාන උතුර ප්‍රජා මධ්‍යස්ථානය වෙත සභාව විසින් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වට තාප්පය මීටර් 150 ක ප්‍රදේශයක් ආවරණය කරමින් තනා තිබුණි. ඉන් මීටර් 111.05 ක් පමණක් පින්තාරු කර රු.37,650 ක මුදලක් ගෙවා තිබුණි. ඒ අනුව, ඉටු නොකළ වැඩ සඳහා එනම්, මීටර් 38.95 ක් සඳහා රු.9,776 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) වාහන අංගනය සඳහා වූ වට තාප්පය රු.790,460 ක පිරිවැයකට තනා තිබූ නමුත්, අංගනය භාවිතා කිරීම සඳහා මේ දක්වාම කටයුතු කර නොතිබුණි. ඒ අනුව අපේක්ෂිත අරමුණු ඉටුව නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) කාර්යාල ගොඩනැගිල්ල තැනීම සඳහා 2012 වර්ෂයේදී දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් රු. 11,999,424 ක් වූ ණය මුදල නිරවුල් කිරීම සඳහා මේ දක්වාම සභාව විසින් කටයුතු කර නොතිබූ අතර, ඒ මත රු. 3,290,367 ක පොළියක් ගෙවා තිබුණි.

(ආ) පසුගිය වසර 03 තුළදී වෙනත් ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලද වාහන 05 ක් සභාව විසින් භාවිතා කර තිබුණි. එනමුත් 2016 අගෝස්තු 25 දින වනතුරුත් එම වාහන සභාව නමින් ලියාපදිංචි කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 හා 2014 වර්ෂ තුළදී කුවිතාන්සි පොත් නවයක් නැතිවී තිබුණි. වගකිව යුතු නිලධාරීන් විසින් අදාළ කුවිතාන්සි පොත් මඟින් ලද මුදල් සභාවට භාරදී නොතිබුණි. හිටපු සභා ලේකම් සහ සේවකයින් 5දෙනෙකු 2015 පෙබරවාරි 17 දිනැති ඔවුන්ගේ ලිපිය මඟින් එම පොත් ලැබී ඇති බවත්, අදාළ මුදල් ඔවුන් විසින් ගෙවන බවත් දක්වා තිබුණි. 2016 පෙබරවාරි 08 දින පොත් 02 ක් සඳහා පමණක් රු.160,900 ක් ගෙවා තිබුණි. එනමුත් ඔවුන්ට එරෙහිව පළාත් මූල්‍ය රීති 71.3 ප්‍රකාරව විනය පියවර ගෙන නොතිබූ අතර අනෙක් පොත් 07 සඳහා සිදු වූ පාඩුව තක්සේරු කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 පාරිසරික ගැටළු

----------------

සභාව විසින් එකතු කළ කසල මහනුවර මාර්ගයට ආසන්න වනගත ප්‍රදේශයකට බැහැර කර තිබූ අතර ඒවා පරිභෝජනය කිරීම නිසා වනයේ ජීවත්වන අලින්ට තර්ජනයක් වී තිබුණි.

3.4 අනාර්ථික ගනුදෙනු

---------------------

1980 අංක 46 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව සේවක අර්ථසාධක අරමුදල සඳහා වූ දායක මුදල් අදාළ මාසය අවසානයට පෙර ප්‍රේෂණය කළ යුතු වේ. එනමුත් වගකිව යුතු නිලධාරීන් සභාවේ සේවකයින්ගේ 2012 ජනවාරි සිට 2014 අප්‍රේල් දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා දායක මුදල් නියමිත දිනවලදී ප්‍රේෂණය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සභාව විසින් රු.40,919 ක මුදලක් අධිභාර වශයෙන් ගෙවා තිබුණි.

3. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

-----------------------------------------

3.1 නිෂ්ක්‍රීය වත්කම්

------------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) 2015 වර්ෂය තුළදී මිලදී ගත් යතුරුපැදි 2ක් මාස 03 ක් තිස්සේ භාවිතයෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) සභාවට අයත් තම්බලාගාමම් පොදු වෙළඳපොළ 2015 දෙසැම්බර් 23 දින රු.531,996 ක පිරිවැයකට පිළිසකර කර තිබුණි. එනමුත් 2017 ජුනි 27 දින වන තුරුම එය නිෂ්ක්‍රීයව තිබුණි.

(ඇ) කසළ ඉවත් කිරීම සඳහා පළාත් විශේෂ සංවර්ධනය ප්‍රදාන යටතේ රු. 530,000 ක මුදලකට 2016 නොවැම්බර් 21 දින ද්විත්ව රෝද ට්‍රැක්ටරයක් හා ට්‍රේලරයක් සභාව විසින් මිලට ගෙන තිබුණි. එනමුත් ඒවා භාවිතයෙන් තොරව සභාවේ රථ ගාලේ නිෂ්ක්‍රීයව පැවතුණි. හානියට පත් වෙනත් ද්විත්ව රෝද ට්‍රැක්ටරයක්ද පරිශ්‍රයේ තිබුණි.

4.2 වාර්ෂික සමීක්ෂණ මණ්ඩල

----------------------------

2015 වර්ෂය සඳහා වූ සමීක්ෂණ 2016 අගෝස්තු 16 දින පවත්වා අයිතම 33 ක් විකිණීමටද, අයිතම 11 ක් අළුත්වැඩියා කිරීමට ද මණ්ඩලය විසින් නිර්දේශ කර තිබුණි. තවද, අයිතම 06 ක් විනාශ කිරීමට එමගින් නිර්දේශ කර තිබුණි. විගණිත දින වූ 2017 මාර්තු 28 දින දක්වාත් මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර වෙනුවෙන් විශේෂ අවධානය අවශ්‍ය වේ.

| | පද්ධති හා පාලන | අවශ්‍ය අවධානය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | I. ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කිරීම<br>II. සභාවේ නිෂ්ක්‍රීය වත්කම් උපයෝජනය |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | I. කොන්ත්‍රාත් පිරිනැමීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීම.<br>II. ප්‍රජා මධ්‍යස්ථානවලට කොන්ත්‍රාත් පිරිනැමීමේදී මුදල් කොමිසමේ චක්‍රලේඛ උපදෙස් අනුගමනය කිරීම. |